# මුහුණුපොත (Facebook) භාවිතය, එහි අරමුණු සහ භික්ෂූන් වහන්සේ

## (පේරාදෙණිය විශ්වවිද්‍යාලයීය ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ඇසුරෙන්)

පිටතලාවේ විමලසාර හිමි[1]

නූතනය වනවිට අන්තර්ජාලය ඔස්සේ නිර්මාණය වී ඇති සමාජ වෙබ් අඩවි අතර මුහුණුපොතට (Facebook) හිමි වන්නේ සුවිශේෂී ස්ථානයකි. මිතුරන් කිහිපදෙනෙකු අතර අදහස් හුවමාරු කිරීමේ ක්‍රමෝපායක් වශයෙන් සරලව ආරම්භ වූ මුහුණුපොත මේ වන විට ලෝකය පුරා අතිශය ජනප්‍රියත්වයට පත්ව තිබේ. ලංකාවේ ද ගිහි සමාජයේ මෙන්ම පැවිදි පැවිදි සමාජයේ ද මුහුණුපොත ඉතා ජනප්‍රිය අංගයක් බවට පත්ව තිබේ.මෙම පර්යේෂණ පත්‍රිකාවේදී අධ්‍යයනය කරන්නේ භික්ෂූන් වහන්සේලා මුහුණපොතට එළඹීමෙන් සාධනය කරගැනීමට අපේක්ෂා කරන්නේ කවරාකාරයේ අරමුණු ද? මුහුණුපොතෙහි ඔවුන්ගේ ක්‍රියාකාරිත්වය කවරාකාරේද? යන්න පිළිබඳවය. පර්යේෂණ ක්‍රමය වශයෙන් ප්‍රශ්නාවලී ක්‍රමය යොදා ගැනිණ.

නූතන සන්නිවේද මාධ්‍ය අතර මුහුණුපොතට හිමි වන්නේ ප්‍රධානස්ථානයකි. මුහුණුපොත සන්නිවේදනයට පමණක් නොව කාර්යයන් කිහිපයක් ඉටු කරගැනීමට යොදා ගනී. එබැවින් වර්තමානය වන විට ලෝකයේ පමණක් නොව ලංකා සමාජයේ ද මුහුණුපොත ඉතා ජනප්‍රියය. මෑත කාලීනව භික්ෂූන් වහන්සේලා ද මුහුණුපොතෙහි හිමිකරුවන් බවට පත්වෙමින් සිටිති. ලෝකෝත්තර සුවයක් අපේක්ෂා කරගනිමින් කටයුතු කරන භික්ෂූන් වහන්සේලා මුහුණුපොත වැනි ලෞකික ක්‍රියාකලාප කෙරෙහි යොමු වීම සැලකිය යුතු කාරණාවකි. භික්ෂූන් වහන්සේ ද සාමාජික පුද්ගලයකු වන හෙයින් කාලානුවර්තීව පැන නගින ප්‍රවණතාවලින් මෑත්වීමට උන්වහන්සේලාටද නොහැකිවේ. එබැවින් නූතනය වන විට විශේෂයෙන් තරුණ භික්ෂූන් වහන්සේලාගේ අවධානය මුහුණුපොත කෙරෙහි යොමු වීමේ තිබේ. එයින් උන්වහන්සේලා සාධනය කරගැනීමට අපේක්ෂිත අරමුණු කිහිපයකි. ඒ අතරදැනුම ලබාගැනීම, යහලුවන් ඇසුරු කිරීම, ධර්ම ප්‍රචාරය, තොරතුරු :ය්දිසච* දැනගැනීම, විනෝදස්වාදය වැනි දෑ ප්‍රධාන වේ. පහත දැක්වෙන්නේ මෙම පර්යේෂණයේදී අනාවරණය කරගත් තොරතුරු අනුව එම අරමුණුවල ප්‍රමුඛතා පිළිබඳ දත්ත සටහනකි.




1 සහාය කථිකාචාර්ය, සිංහල අධ්‍යයන අංශය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය
wimsarap@gmail.com

වර්තමානයේ ක්‍රියාත්මක වන සමාජ, දේශපාලන, ආර්ථික, අධ්‍යාපනික ක්‍රමවේද අනුව තාක්ෂණය වැනි දෑ සමඟ ගනුදෙනු කිරීමෙන් වැලකී සිටීමට භික්ෂුවට නොහැකි වී තිබේ. එබැවින් වයස 15-25 කාලවකවානුව වන විට බොහෝ තරුණ භික්ෂූන් වහන්සේලා සතුව මුහුණු පොතේ ගිණුමක් පවතින බවත් ඒ අතරින් බොහෝ දෙනෙකු දිනකට පැය 1-2 දක්වා කාලයක් ඒ සඳහා වෙන් කරන බවත් මෙම පර්යේෂණයේදී අනාවරණය විය. එසේම ඇතැම් භික්ෂූන් වහන්සේලා සතුව ගිණුම් දෙක තුනක් පවතින අවස්ථා ද හමු විය. ඕනෑම තාක්ෂණික ප්‍රවණතාවක හොඳ, නරක යන අංශ ද්වයම දැකගත හැකිය. මුහුණු පොතද එවැන්නකි. එහෙයින් එහි පවත්නා සාධනීය දෑ කෙරෙහි අවධානය යොමු කිරීමට භික්ෂූන් වහන්සේ විසින් සැලකිලිමත් විය යුතුය. සමස්තයක් ලෙස වර්තමානය වනවිට තරුණ භික්ෂූන් වහන්සේලා බහුල වශයෙන් මුහුණුපොතට එළැඹෙන බවත් යහලුවන් ඇසුරු කිරීම, දැනුම ලබා ගැනීම, විනෝදස්වාදය, ධර්මප්‍රචාරය සහ තොරතුරු දැන ගැනීම වැනි දෑ ප්‍රධාන වශයෙන් එයින් ඉටු කරගැනීමට අපේක්ෂා කරන බවත් අනාවරණය විය.

**ප්‍රමුඛ පද :** අන්තර්ජාලය, සමාජ වෙබ්අඩවි, මුහුණුපොත, භික්ෂුව